**මහරගම නගර සභාව**

**කොළඹ දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 ජුලි 09 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 ජුලි 06 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 දෙසැම්බර් 11 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මහරගම නගර සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන වටිනාකම රු.435,388 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේදී ජපානයේ කවසාකි රොටරි සමාජයෙන් පරිත්‍යාගයක් වශයෙන් ලැබී තිබූ නිශාන් වර්ගයේ ගාබේජ් ට්‍රක් රථයේ වටිනාකම වූ රු.2,400,000 ක් (තක්සේරු වටිනාකමක්) ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර මේ වෙනුවෙන් දරන ලද රු.337,583 ක මූලික වියදම් ද ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුමේ ශේෂය, ස්ථාවර වත්කම් ශේෂයට වඩා රු.5,534,481 ක් වැඩියෙන් දැක්වුණි.

(ඈ) බැංකුවෙන් ලැබී තිබූ ශේෂ තහවුරු කිරීමේ ලිපි වලට අනුව ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය රු.2,729,217 ක් වුවද පොලිය වශයෙන් රු.19,128,594 ක් ගිණුම් ගත කර තිබුණි.

(ඉ) මුද්දර බදු ආදායම වෙනුවෙන් 2011 ට පෙර වර්ෂ සඳහා ලැබිය යුතු රු.79,050,816 ක් ගිණුම් වල පෙන්වා නොතිබුණි.

### 1.3.2 නොසැසඳුන පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 19 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.346,567,164 ක්වූ අතර උපයෝගී ලේඛන අනුව එම ගිණුම් ශේෂවල එකතුව රු.270,470,578 ක් විය.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් 03 ක එකතුව රු.95,637,088 ක්වූ ශේෂයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.4 නිරවුල් නොකරන ලද ගිණුම්

ගිණුම් විෂයන් 05 ක රු.7,057,279 ක් ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.58,591,545 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.37,003,872 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

### 2.2.1 බැංකු ගිණුම්

(අ) මදල් පොත අනුව 2011 ජනවාරි 01 දිනට බැංකු අයිරාව රු.76,614,080 ක් වූ අතර 2011 වර්ෂය සඳහා මුදල් පොත පවත්වා නොතිබීම නිසා ශේෂයන් නිරීක්ෂණය කරගත නොහැකි වුවද, ගණකාධිකාරීවරයා විසින් 2011 දෙසැම්බර් 31 දිනට රු.53,482,956 ක අයිරා ශේෂයක් ඇති බවට විස්තර ඉදිරිපත් කලද, ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව අයිරා ශේෂය රු.45,355,501 ක විය.

(ආ) ජංගම ගිණුමකට අදාලව 2010 ජනවාරි සිට 2011 දෙසැම්බර් දක්වා වූ බැංකු සැසඳුම් ප්‍රකාශ ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 395 (ඇ) ප්‍රකාර 2012 අගෝස්තු 24 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

(ඇ) නිකුත් කල නමුත් මාස 06 ක් ඇතුළත බැංකුවට ඉදිරිපත් නොවූ එකතුව රු.100,029 ක් වූ චෙක්පත් 20 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2011 මාර්තු 03 සහ නොවැම්බර් 01 දින තැන්පත් කර තිබූ පිළිවෙලින් රු.16,162 ක් හා රු.92,472 ක් වූ චෙක්පත් 02 ක වටිනාකම හා එකතුව රු.18,425 ක් වූ මුදල් ඇණවුම් 07 ක වටිනාකම්ද උපලබ්ධි වී නොතිබුණද ඒ පිළිබඳව පසු විපරම් කර නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත, තථ්‍ය හා හිඟ ආදායම්

(අ) සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය (බිල් කිරීම) | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 81,700 | 79,262 | 90,277 |
| (ii) | බදු කුලී | 6,410 | 8,925 | 3,699 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,099 | 979 | 1,587 |
| (iv) | වෙනත් ආදායම් | 117,352 | 123,923 | 134,499 |

(ආ) වරිපනම් බදු 2010 වර්ෂයට වඩා 2011 වර්ෂයේදී රු.1,600,000 ක් අඩුවෙන් ඇස්තමේන්තු කර තිබුණි.

(ඇ) බදුකුලී ආදායම ඇස්තමේන්තු කිරීමේදී තථ්‍ය ආදායම පිළිබඳ සැලකිලිමත් වී නොතිබුණි.

### 2.3.2 දැන්වීම් පුවරු ගාස්තු

2011 දෙසැම්බර් 31 දින වන විට දැන්වීම් පුවරු වලින් රු.939,122 ක මුදලක් නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 162 (1) ආ වගන්තියේ විධිවිධාන අනුවඅයකර ගෙන නොතිබුණි.

### 2.3.3 මස්කඩ බදු

බදු දී තිබුණු මස්කඩ වලින් 2002 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා අයවීමට තිබූ රු.1,842,023 ක බදු මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

### 2.4.1 අයවීමට ඇති සේවක ණය

2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂ වල එකතුව රු.31,136,042 ක් වූ අතර, දීර්ඝ කාලයක සිට අයනොවී පවතින සේවක ණය ශේෂ වල එකතුව රු.372,721 ක් විය. සාරාංශගත තොරතුරු පහතින් දැක්වේ.

| විස්තරය | සේවක සංඛ්‍යාව | අයවිය යුතු මුදල |
|---|---|---|
| | | රු. |
| සේවය හැර යෑම | 56 | 146,377 |
| මිය යෑම | 22 | 100,166 |
| විශ්‍රාම යෑම | 03 | 99,187 |
| ස්ථාන මාරු | 02 | 26,991 |
| | 83 | 372,721 |

### 2.4.2 ලැබිය යුතු ගිණුම්

(අ) 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල එකතුව රු.230,226,215 ක් වූ අතර කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙහි ආයෝජනය කර ඇති රු.5,505,190 ක් සඳහා 2006 වර්ෂයේ සිට කිසිම ලාභාංශයක් ලැබී නොතිබුණි.

## 2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1971 ජුලි 26 දිනැති අංක 810 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන අනුව වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් සේවකයන්ගෙන් අයකල යුතු මුදල අදාල මාසයේදී හෝ ඊට පසුව එළඹෙන මාසයේදී අයකරගත යුතු වුවත් 2011 වර්ෂයට අදාලව අයවිය යුතු රු.708,095 ක මුදල 2012 අගෝස්තු 24 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(අ) සැලසුම් අනුමත කිරීම හා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම් මගින් සභාව විසින් උපයාගෙන තිබූ ආදායමින් නාගරික සංවර්ධන අධිකාරයට 2010 හා 2011 වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතුව ඇති රු.3,746,387 ක 2012 අගෝස්තු 24 දින වන විටත් සභාවේ ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 2.6 අභ්‍යන්තර විගණනය

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 (1) සහ (2) හි දැක්වෙන විධිවිධාන පරිදි අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු සංවිධානය කරගෙන නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3. පද්ධති පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) අභ්‍යන්තර විගණනය

(ඈ) මූල්‍ය පාලනය

(ඉ) තොග පාලනය

(ඊ) ආදායම් පරිපාලනය

(උ) වත්කම් කලමනාකරණය

(ඌ) ණයගැති, ණයහිමි පාලනය

(එ) මානව සම්පත් කලමනාකරණය